# කාර්මික සැලසුම්

කාර්මික සැලසුමක් යනු යම් භාණ්ඩයකට නව පෙනුමක් ලබාදෙන, නිර්මාණකරුවෙකු විසින් නිර්මාණය කරන ලද අලුත් මෝස්තරයකි. එය භාජනයක්, ගෘහ භාණ්ඩයක් හෝ පැනක් වැනි භාණ්ඩයක් සඳහා වූ ත්‍රිමාණ මොස්තරයක් හෝ සුභ පැතුම් පතක් වැනි භාණ්ඩයක් සඳහා වූ ද්විමාණ මොස්තරයක් විය හැකිය.

## කාර්මික සැලසුමක අගය

කාර්මික සැලසුමක් යම් භාණ්ඩයක පෙනුම අලුතින් ආකර්ශනීය කරමින් අදාල භාණ්ඩයේ වාණිජ වටිනාකම තීව්‍ර කරයි. වාණිජ වටිනාකම වැඩිවෙත්ම භාණ්ඩයේ අලෙවිය වැඩිවීමෙන් නිර්මාණකරුට ද ආයෝජකයාට ද ආර්ථික ප්‍රතිලාභ හිමිවේ. එ නිසාම නිර්මාණකරණය ද, ආයෝජන ද පුළුල් වන අතර එය රටේ සංවර්ධනයට ද රුකුලකි. නවතම කාර්මික සැලසුම් සහිත භාණ්ඩ මිලට ගන්නා පාරිභෝගිකයා ද තෘප්තිමත් අයකු බවට පත්වේ.

## ආරක්ෂාව

කාර්මික සැලසුමකට නීතිමය අරක්ෂාව හිමිවේ. ඒ සඳහා එය බුද්ධිමය දේපල කාර්යාලයේ නිසි පරිදි ලියාපදිංචි කල යුතුය.ලියාපදිංචි කාර්මික සැලසුමක් වසර 05 ක් වලංගු වන අතර තවත් වසර 05 බැගින් දෙවතාවක් අලුත් කල හැකිය.

ලියාපදිංචි හිමිකරුට එම කාර්මික සැලසුම, භාණ්ඩ නිෂ්පාදනය සඳහා භාවිතා කිරීමට ද, අන් අය තම අවසරයකින් තොරව එය ප්‍රතිනිර්මාණය කිරීම හෝ භාවිතා කිරීම වැලැක්වීමට ද අයිතිය තිබේ. තම හිමිකම් අන්සතු කිරීමට හා අවසර ගිවිසුම්වලට එළඹීමට ද හිමිකරුට අයිතිය ඇත. එම අයිතීන් උල්ලංඝනය කිරීමට එරෙහිව සිවිල් හා අපරාධ අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමට පිළිවන.

ලියාපදිංචි කාර්මික සැලසුමක් වලංගු වන්නේ ලංකාව තුල පමණකි. විදේශීය රටක ආරක්ෂාව අවශ්‍ය වන්නේ නම් එය එම රටේ නීතිය අනුව ලියාපදිංචි කර ආරක්ෂාව සළසා ගත යුතුය.

## ලියාපදිංචි කල හැකි බව

කාර්මික සැලසුමක් ලියාපදිංචි කල හැක්කේ එය නව කාර්මික සැලසුමක් වන්නේ නම් පමණකි. “නවතාවය” යන්නෙන් අදහස් වන්නේ එම කාර්මික සැලසුම මීට පෙර කවර ආකාරයකින් හෝ මහජනයා වෙත ඉදිරිපත් නොවී තිබීමය. එමෙන්ම එය ගර්හනීය, සදචාර විරෝධී හෝ මහජන විරෝධී නොවන මෙන්ම ආගමික හෝ වාර්ගික හැගීම් පැරවීමට ඉඩකඩ නැති සැලසුමක් විය යුතුය.

## අයදුම් කිරීම සහ ලියාපදිංචි කිරීම

නියමිත ආකෘති පත්‍රයේ නිසිපරිදි ලියාපදිංචිය සඳහා අයදුම්පතක් ඉදිරිපත් පත් වූ විට අයදුම්පත නිවැරදි ද යන්න හා කාර්මික සැලසුම නීත්‍යානුකූලව ලියාපදිංචි කළ හැකිද යන්න පරීක්ෂා කෙරේ. අයදුම්පත නිවැරදි නම් ද, කාර්මික සැලසුම පිළිගත හැකිනම් ද එය සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි භාෂාවලට පරිවර්තනය කර ගැසට් මගින් ප්‍රසිද්ධ කෙරේ. අනතුරුව මාස දෙකක් ඇතුළත යෝජිත ලියාපදිංචියට විරෝධතා නැතොත් ලියාපදිංචිය සිදුකරනු ලැබේ.

කාර්මික සැලසුමක් ප්‍රතික්ෂේප වෙතොත් ඒ සඳහා විභාගයක් ඉල්ලා සිටිය හැකිය. ගැසට් මගින් ප්‍රසිද්ධ කළ පසු විරෝධතා ඇතොත් දෙපාර්ථවයම කැඳවා විභාගයක් කෙරේ. කාර්මික සැලසුම පිළිගැනීම හෝ පිළිනොගැනීම තීරණය කෙරෙන්නේ එම පරීක්ෂණයන්හිදී ඉදිරිපත් වන කරුණු මතය. අධ්‍යක්ෂක ජනරාල්වරයාගේ තීරණයට එරෙහිව අධිකරණයට අභියාචනා කළ හැකිය.

ඔබට අවශ්‍ය වැඩි විස්තර සඳහා අමතන්න;

**Tel:** 011- 2689368, 011- 2688768 **Fax:** 0112689367 **Email:** nipos@slt.lk,
**Web Site:** www.nipo.gov.lk

## ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපල කාර්යාලය

සැකසුම:
එස්.පී.එම්.කේ.ගුණසේකර, පර්යේෂණ සහකාර,
ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය.